මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**නිකුත් කළේ** : බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව

**දිනය** : 2021 ජනවාරි 12

# කොන්දේසි පදනමින් සීමිත අරමුණක් සඳහා ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පී එල් සී ආයතනයේ ව්‍යාපාර කටයුතු නැවත ආරම්භ කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් මහජනතාවගේ සහ ආයතනයේ තැන්පත්කරුවන්ගේ යහපත සඳහා **දැඩි කොන්දේසිවලට** යටත්ව, 2011 අංක 42 දරණ මුදල් ව්‍යාපාර පනතේ 31(5)(අ) වන වගන්තිය ප්‍රකාරව, සීමිත අරමුණක් සහ සීමිත කාලයක් සඳහා, මුදල් මණ්ඩලය විසින් පත් කරන ලද කළමනාකරණ මණ්ඩලයේ අධීක්ෂණය යටතේ ආයතනයේ පවත්නා ඉතිරි තැන්පතුවලින් සියයට 50ක ප්‍රමාණයක් ආපසු ගෙවීම (ආපසු ගෙවීමේ සැලැස්ම) සඳහා **පමණක්** 2021 ජනවාරි 13 සිට 2021 අප්‍රේල් 12 දක්වා වන තෙමසක සීමිත කාල සීමාවක් තුළ ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පී එල් සී ආයතනයේ **ව්‍යාපාර කටයුතු නාමිකව නැවත ආරම්භ කිරීමට** තීරණය කරන ලදී.

ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පී එල් සී ආයතනයේ පැවති විවිධ අක්‍රමිකතා සහ ඒ හේතුවෙන් ඇතිවූ ගැටලුකාරී තත්ත්වයන් මඟ හරවා ගැනීමට ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය අපොහොසත් වීම හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 2018 ජනවාරි 02 දින ආයතනයේ අධ්‍යක්ෂවරුන් වෙත විධාන නිකුත් කළ අතර එම ආයතනයේ කටයුතු අධීක්ෂණය සඳහා කළමනාකරණ මණ්ඩලයක් පත් කිරීමට කටයුතු කරන ලදී.

මුදල් මණ්ඩලයේ විධාන ප්‍රකාරව ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පී එල් සී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් එම ආයතනය යථා තත්ත්වයට පත් කිරීම සඳහා සුදුසු ආයෝජකයෙකු/ආයෝජකයන් ඊගෙන ඒමට නියෝග කර තිබුණද, කිසිදු සාධනීය ආයෝජන යෝජනාවලියක් ඉදිරිපත් නොවූ අතර ආයතනයේ මූල්‍ය තත්ත්වය ද අඛණ්ඩව පිරිහීමට ලක්විය. කෙසේ වුවද, 2018 සහ 2019 වර්ෂවලදී ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පී එල් සී ආයතනයේ තැන්පතුවලින් 30% ක ප්‍රමාණයක් ආපසු ගෙවා දමන ලදී.

ආයතනයේ මූල්‍ය තත්ත්වය අඛණ්ඩව පසුබෑමට ලක්වීම සහ ආයතනය නැවත යථා තත්ත්වයට පත් කිරීම සඳහා ක්‍රියාත්මක කළ හැකි සාධනීය ආයෝජන යෝජනාවලියක් ඉදිරිපත් නොවීම හේතු කොටගෙන, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින්, 2011 අංක 42 දරණ මුදල් ව්‍යාපාර පනතේ 31(1) වන වගන්තිය ප්‍රකාරව, 2020 ජුලි 13 වන දින සිට බලපැවැත්වෙන පරිදි ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පී එල් සී ආයතනයේ ව්‍යාපාර කටයුතු අත්හිටුවීමට තීරණය කරන ලදී.

එම ආයතනයේ ව්‍යාපාර කටයුතු අත්හිටවූ කාල සීමාව තුළ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක ක්‍රමය යටතේ රක්ෂිත තැන්පතුකරුවන් හට වන්දි ගෙවීම මහජන බැංකුවේ දීපව්‍යාප්ත ශාඛා හරහා ආරම්භ කරන ලද අතර, 2020 වර්ෂය අවසානය වන විට එක් රක්ෂිත තැන්පතුකරුවෙකු සඳහා රු. 600,000/- ක උපරිමයකට යටත්ව 9,660 ක් වන මුළු තැන්පතුකරුවන් අතරින් සියයට 25ක ප්‍රමාණයකට රු. මිලියන 834.1 ක මුදලක් ගෙවා අවසන් කර ඇත. මෙම මුදල් ප්‍රමාණය, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක ක්‍රමය යටතේ ආවරණය වන රු. මිලියන 982.9න් සියයට 84.9 ක ප්‍රමාණයකි. තවද, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක ක්‍රමය යටතේ මේ දක්වා රක්ෂණ වන්දි මුදල් ලබා නොගත් තැන්පතුකරුවන්ට එක තැන්පතුකරුවෙකුට රු. 600,000/-ක උපරිමයකට යටත්ව රක්ෂණ වන්දි මුදල් ගෙවීම අඛණ්ඩව සිදු කෙරෙනු ඇත.

ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පී එල් සී ආයතනයේ ඉතිරි තැන්පතු මුදල්වලින් කොටසක් ආපසු ගෙවීමට උපයෝගී කර ගත හැකි සැලකිය යුතු මුදලක් ව්‍යාපාර කටයුතු අත්හිටවූ කාල සීමාව තුළ ප්‍රධාන වශයෙන් රන් ණය ආපසු අය කර ගැනීම මඟින් රැස්කර ගැනීමට ආයතනයට හැකි විය. තවද, එසේ අයකරගත් මුදල් භාවිතා කර මෙම ආයතනයේ ඉතිරි මුදල් තැන්පතු ගෙවීමට කටයුතු කරන ලෙස තැන්පත්කරුවන්ගෙන් මෙන්ම ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පී එල් සී ආයතනයෙන්ද ශ්‍රී ලංකා මහ බැංකුව වෙත දිගින් දිගටම ඉල්ලීම් ඉදිරිපත් විය.

ප්‍රාග්ධන යෙදවීමක් මඟින් ආයතනය නැවත යථා තත්ත්වයට පත් කිරීම සඳහා ක්‍රියාත්මක කළ හැකි යෝජනාවලියක් ඉදිරිපත් නොවීම, ආයතනයේ මූල්‍ය තත්ත්වය අඛණ්ඩව පසුබෑමට ලක්වීම සහ දීර්ඝ කාලයක් ගතවන ඈවර කිරීමේ ක්‍රියාවලිය හරහා තැන්පතු මුදලින් කොටසක් ලැබීමේදී තැන්පත්කරුවන්ට වන මූල්‍යමය බලපෑම, යන කරුණු සැලකිල්ලට ගෙන ඉහත පළමු ඡේදයෙහි සඳහන් වන ආපසු ගෙවීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා **පමණක්** 2021 ජනවාරි 13 සිට 2021 අප්‍රේල් 12 දක්වා වන තෙමසක සීමිත කාල සීමාවක් තුළ ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පී එල් සී ආයතනයේ **ව්‍යාපාර කටයුතු නාමිකව නැවත ආරම්භ කිරීමට** මුදල් මණ්ඩලය තීරණය කරන ලදී.

මුදල් මණ්ඩලය මඟින් පත් කරන ලද කළමනාකරණ මණ්ඩලය තවදුරටත් ආයතනයේ කටයුතු කළමනාකරණය සහ ආපසු ගෙවීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කරනු ලබනු ඇති අතර ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පී එල් සී ආයතනයේ අධ්‍යක්ෂවරුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ සම්බන්ධිත පාර්ශවවලට එම ආයතනයේ මොනයම් හෝ කටයුත්තකට කිසිඳු ආකාරයකින් සම්බන්ධ වීම තහනම් කර ඇත.

ඉහත කී ආපසු ගෙවීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සහ ආයතනයට අයවිය යුතු සියලු මුදල් අයකර ගැනීම හැර කිසිඳු මූල්‍ය ව්‍යාපාරයක් හෝ මූල්‍ය නොවන ව්‍යාපාරයක් කරගෙන යාමට ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පී එල් සී ආයතනයට **අවසර දී නොමැති බව** ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහජනතාව වෙත දැනුම් දෙනු ලැබේ. එබැවින්, ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පී එල් සී ආයතනයට ගෙවිය යුතු මුදල් ගෙවීම හැර, එම ආයතනයේ **මුදල් තැන්පත් කිරීම** හෝ වෙනත් කිසිඳු ආකාරයකින් ව්‍යාපාර කටයුතු සිදු කිරීමෙන් **වළකින** ලෙස මහජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටී.

ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පී එල් සී ආයතනයෙන් ණය ලබාගත් සියලු පාර්ශ්වයන් සිය ගෙවීම් එම ආයතනය නමින් පවතින පහත බැංකු ගිණුම් හරහා පමණක් නියමිත වේලාවට සිදු කළ යුතු අතර එම සියලු ගෙවීම් සම්බන්ධව වාර්තා පවත්වා ගනිමින්, නියමිත ගෙවීම් නිසි පරිදි නොගෙවීම නිසා ඇති විය හැකි නීතිමය ගැටලු මගහරවා ගන්නා ලෙස දැනුම් දෙනු ලැබේ.

| බැංකුවේ නම | ශාඛාව | ගිණුම් අංකය |
|---|---|---|
| සම්පත් බැංකුව | ප්‍රධාන ශාඛාව | 2930013377 |
| කොමර්ෂල් බැංකුව | කොල්ලුපිටිය ශාඛාව | 1107428801 |

ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පී එල් සී ආයතනයෙහි තැන්පතු වටිනාකමින් මේ වන විට ගෙවා ඇති සියයට 30ක ප්‍රමාණය සහ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක ක්‍රමය යටතේ ආවරණය වන රක්ෂණ වන්දි මුදල හැර, ඉතිරි තැන්පතු වටිනාකමින් සියයට 50 ක් ගෙවීම ආරම්භ කරන දිනය ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පී එල් සී ආයතනය විසින් තැන්පත්කරුවන් වෙත ඉදිරියේදී දැනුම්වත් කිරීමට කටයුතු කරනු ඇත.

තවදුරටත් ඉහත කරුණුවලට අදාළ පැහැදිලි කරගැනීම් අවශ්‍ය නම් පහත දක්වා ඇති ක්‍රම ඔස්සේ විමසීම් සිදු කළ හැක.

| ආයතනය | අවශ්‍යතාව | දුරකථන අංක | විද්‍යුත් ලිපිනය |
|---|---|---|---|
| බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව | සීමිත කාල සීමාවකට ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පී එල් සී ආයතනයේ ව්‍යාපාර කටයුතු නාමිකව නැවත ආරම්භ කිරීම සම්බන්ධ විමසීම් සඳහා | 011 2477504<br>011 2398806<br>011 2398595 | snbfi_query@cbsl.lk |
| නිරාකරණය හා බලගැන්වීමේ දෙපාර්තමේන්තුව | තැන්පතු රක්ෂණ ක්‍රමය යටතේ මුදල් ගෙවීම සම්බන්ධ විමසීම් සඳහා | 011 2477261 | dred@cbsl.lk |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානය | සියලු පොදු ගැටලු සම්බන්ධ විමසීම් සඳහා | 011 2477966 | |
| ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පී එල් සී ආයතනය/ මුදල් මණ්ඩලය මගින් පත්කරන ලද කළමනාකරණ මණ්ඩලය | තැන්පතු, උකස් ණය සහ ආයතනයෙන් ලබා ගත් අනෙකුත් ණය මුදල් සම්බන්ධ සියලු විමසීම් සඳහා | 011 7534800 | info@sfs.lk |